

01. මහා බ්‍රහ්මයා විසින් වර්ණ භේදයක් සහිතව මනුෂ්‍ය වර්ගයා මවන ලැදැයි වෛදික සාහිත්‍යයෙහි දැක්වේ. එහි ලා චතුර්වර්ණය මැවීමේ පදනම ලෙස සලකා ඇත්තේ,
1. නියතිවාදයයි. 2. ගුණ කර්ම විභාගයයි. 3. හේතුඵලවාදයයි.
4. අහේතු අප්‍රත්‍යයවාදයයි. 5. පරිණාමවාදයයි.

02. භාරතීය සමාජය තුළ සියලු අංශවලින් සිය ආධිපත්‍යය තහවුරු කරගත් බ්‍රාහ්මණ කුලය වඩාත් ප්‍රබලව තම අධිකාරී බලය පැතිරවූයේ,
1. ආගමික හා දේශපාලන ක්ෂේත්‍රවලය.
2. ආගමික හා ආර්ථික ක්ෂේත්‍රවලය.
3. ආගමික හා නිෂ්පාදන ක්ෂේත්‍රවලය.
4. ආගමික හා අධ්‍යාපන ක්ෂේත්‍රවලය.
5. ආගමික හා පරිපාලන ක්ෂේත්‍රවලය.

03. වර්ණ භේදයට අනුව පාරම්පරික රැකීරක්ෂා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා විශේෂිත නියමයක් බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වේ. එය හැඳින්වෙන්නේ,
1. වර්ණ ධර්මය ලෙසය. 2. ආශ්‍රම ධර්මය ලෙසය. 3. ආපද් ධර්මය ලෙසය.
4. බ්‍රාහ්මණ ධර්මය ලෙසය. 5. ස්ව ධර්මය ලෙසය.

04. ආධ්‍යාත්මික විමුක්තිය සඳහා ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව බුදු සමය මගින් අවධාරණය කරයි. එය සනාථ වන්නේ,
1. ථේරී ගාථාවල දැක්වෙන භික්ෂුණින්ගේ ප්‍රකාශන මගිනි.
2. මවක වශයෙන් වන්දනීය තත්වයක් කාන්තාවට හිමිකර දීමෙනි.
3. බිරිඳ ස්වාමියාගේ හොඳ ම මිතුරිය ලෙස හඳුන්වා මෙනි.
4. බිරිඳක් වශයෙන් කාන්තාවගේ අයිතිවාසිකම් තහවුරු කර තිබීමෙනි.
5. කාන්තාවන් ඒ ඒ තැන්හි දී විචක්ෂණශීලීව ක්‍රියාකරන බව දේශනා කිරීමෙනි.

05. පරලොවක් ඇත්දැයි ප්‍රශ්න කළහොත් ඇත කියා හෝ නැත කියා හෝ හෙතම නොකියයි. ඇත එමෙන්ම නැත හෝ ඇත්තෙත් නැත. නැත්තෙත් නැත කියා හෝ නොකියයි. මෙම අවිනිශ්චිතවාදි සංකල්පය ඉදිරිපත් කරන ලද්දේ,
1. නිගණ්ඨනාථපුත්ත ශාස්තෘතුමා. 2. අජිත කේසකම්බලී ශාස්තෘතුමා.
3. පකුධ කච්චායන ශාස්තෘතුමා. 4. පූර්ණ කස්සප ශාස්තෘතුමා.
5. සංජය බෙල්ලට්ඨී පුත්ත ශාස්තෘතුමා.

06. ක්‍රි.පු 6 වෙනි සියවසේ භාරතීය සමාජය සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් සමඟ වාණිජකරණයට ද, නාගරීකරණයට ද ලක්වෙමින් පැවැති බව විවිධ සාධක මගින් තහවුරු වේ. එහි කැපී පෙනෙන ක්‍රියාකාරින් පිරිසක් ලෙස සැලකිය හැක්කේ,
1. සිටුවරුන් ය. 2. රජවරුන් ය. 3. රාජ්‍ය නිලධාරීන් ය.
4. ඉඩම් හිමියන් ය. 5. කර්මාන්තකරුවන් ය.

Past Papers Wiki

07. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ත්‍රිවිධ බලතල එක් අයෙකු සතුව පැවතියත් යුවරජු, සේනාධිපති, පුරෝහිත, අධිකරණ නායක යනාදීන්ගේ සහාය ද ලබාගත් බුද්ධ කාලීන භාරතයේ පැවැති පාලන ක්‍රමය හැඳින්වූයේ,
1. ගණතන්ත්‍ර පාලන ක්‍රමය යනුවෙනි.
2. සමූහාණ්ඩු පාලන ක්‍රමය යනුවෙනි.
3. රාජාණ්ඩු පාලන ක්‍රමය යනුවෙනි.
4. වජ්ජි පාලන ක්‍රමය යනුවෙනි.
5. ලිච්ඡවි පාලන ක්‍රමය යනුවෙනි.

08. බුද්ධ කාලීන භාරතයේ සොළොස්මහා ජනපද පිළිබඳ තොරතුරු විමසීමේ දී බුදු සිරිත හා එම පාලන ක්‍රම පිළිබඳ අධ්‍යයනය කළ හැකිය. ඒ අතර කූටාගාර ශාලාව, උදේන, ගෝතමක, සාරන්දද, බහුපුත්තක ආදි චෛත්‍යන් පිහිටා තිබූ රාජ්‍ය වන්නේ,
1. මගධ රාජ්‍යයේ ය. 2. වත්ස රාජ්‍යයේ ය. 3. වජ්ජි රාජ්‍යයේ ය.
4. මල්ල රාජ්‍යයේ ය. 5. අවන්ති රාජ්‍යයේ ය.

09. භාරතීය ආර්ථිකයේ ප්‍රවණතාවයට වාණිජකරණය බෙහෙවින්ම බලපෑවේ ය. වාණිජකරණ ප්‍රවණතාවය උදෙසා සිටුවරුන්ගේ දායකත්වය නොමදව ලැබුණි. එම සිටුවරුන්ගෙන් ලැබුණු සහයෝගයට අමතරව වෙළඳාමේ උන්නතියට වඩාත් වැදගත් අයුරින් දායක වූයේ,
1. සමාජ ශාලා ඇතිවීම යි. 2. ගණිකා වෘත්තීය සමාජගත වීමයි.
3. සම්බාහන මධ්‍යස්ථාන ඇති වීමයි.4. ආපනශාලා ඇති වීමයි.
5. සුප්පාරක තාම්ප්‍රලිප්ති වැනි තොටුපළවල් ඇති වීමයි.

10. ''දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික සම්පරායික යන උපයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා, කරණ බැවින් ද, දෙව් මිනිසුන්ට ශාස්තෘවරයා මෙන්ම ගුරුවරයා වන බැවින්ද බුදු රජාණන්වහන්සේ ....'' වන බවය. හිස් තැනට සුදුසු බුදු ගුණය වන්නේ,
1. සම්මා සම්බුද්ධ. 2. සත්ථා දේවමනුස්සානං. 3. ලෝකවිදූ.
4. සුගත. 5. භගවා.

11. ''කීණාතිවා පරදුක්ඛං හිංසති විනාසේතිති කරුණා'' යන්නෙන් අර්ථවත් වන්නේ,
1. අනුන්ගේ දුකෙහිදි සත්පුරුෂයන්ගේ හදවතෙහි ඇති කරන කම්පනය කරුණාව බව.
2. අනුන්ගේ දුක දැක ගුණ හරිත හදවතක් ඇති අයකු තුළ ඇති වන දයානුකම්පාව කරුණාව බව.
3. අන්‍යන්ගේ දුක් විනාශ කිරීම කරුණාව බව.
4. අන්‍යන්ගේ දුක් කරදර නැති කිරීමේ කැමැත්ත කරුණාව බව.
5. අන්‍යයන්ට උපකාර කිරීම කරුණාව බව.

12. ''බුදුරාජාණන් වහන්සේ ලෞකික ආසා නැමැති ගිනිගත් නිවස තුළ දැවෙන දරුවන් බේරා ගැනීමට මාර්ගය යොදන්නා වුත් , බේරා ගැනීමෙන් පසු නිර්වාණය නැමැති ආරක්ෂක ස්ථානයට මග පෙන්වන්නා වුත් පියකු බඳුය'' යනුවෙන් බුදුරාජාණන් වහන්සේ පිළිබඳ ඇගයීමක් කළ නූතන චින්තකයා වන්නේ,
1. මහාචාර්ය සෝන්ඩර්ස්. 2. එඩ්වින් ආර්නෝල්ඩ්. 3. බර්ට්‍රන්ඩ් රසල්.
4. මහාචාර්ය මැක්ස් මුලර්. 5. මහාචාර්ය ලක්ෂ්මි නරසු

13. අපගේ පිවිතය හැඩගස්වා ගැනීමේ දී මෙන්ම අප සමාජගතව කටයුතු කිරීමේදී ද මෙම ධර්ම තාවනට කොතෙකුත් මුහුණු දීමට සිදු වුවත් ඒවා උපේක්ෂාවෙන් විඳ දරා ගැනිම මගින් සාමකාමී පිවන රටාවක් ගොඩනගා ගත හැකි බව පැවසෙන්නේ,
1. මහා කරුණා ගුණයෙනි. 2. තාදි ගුණයෙනි. 3. මහා ප්‍රඥා ගුණයෙනි.
4. ආදර්ශවත් නායකත්ව ගුණයෙනි. 5. පද්මාකාර පිවිතය මගිනි.

14. රූපාවචර ධ්‍යාන සතරම ලබාගත් අනාගාමී උපාසකයෙකු හා ධම්මකථික උපාසකයන් අතර අගතනතුර ලැබූ බුද්ධකාලීන උපාසක තෙමේ නම්,
1. නකුල පිතා උපාසකතුමා ය.
2. අනේපිඩු සිටුතුමා ය.
3. උපාලි ගෘහපතිතුමා ය.
4. චිත්ත ගෘහපති උපාසකතුමා ය.
5. ධනංජය සිටුතුමා ය.

15. සිවුවනක් පිරිස අතරින් ''මහා නිධාන'' සූත්‍රයෙන් බණ අසා සෝවාන් ඵලයට පත් තෙරණිය වුයේ,
1. මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය.
2. පටාචාරා තෙරණිය.
3. ඛේමා තෙරණිය.
4. ධම්ම දින්නා තෙරණිය.
5. පුණ්ණා තෙරණිය.

16. සැරියුත් මහා තේරුන් වහන්සේ විසින් දේශිත සූත්‍ර දේශනාවක් නොවන්නේ,
1. සම්මා දිට්ඨි සූත්‍රය.
2. සච්ච විභංග සූත්‍රය.
3. දසුත්තර සූත්‍රය.
4. සුරිය සත්තම සූත්‍රය.
5. සංගීති සූත්‍රය.

17. භික්ෂූන් වහන්සේලාට හා භික්ෂූනින් වහන්සේලාට වැසි සළු , ආගන්තුක වත , ගමික වත , ගිලන් වත , උවටැන් වත , බෙහෙත් , කැඳ ආදියෙන් උවටැන් කිරීම නිසා උභය සංඝයාගේ මාතාව බවට පත්වුයේ,
1. සුමණා උපාසිකාවය.
2. සුජාතා උපාසිකාවය.
3. මල්ලිකා උපාසිකාවය.
4. විශාකා උපාසිකාවය.
5. යශෝධරා උපාසිකාවය.

18. අත්තකාර , පරකාර , ආරම්භකධාතු , පරක්බමධාතු ආදි පාරිභාෂිත වචන මගින් බුදු සමය අවධාරණය කරන ඉගැන්වීම් සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ,
1. පුද්ගලයා යනු හේතුඵල සම්බන්ධයේ ප්‍රතිඵලයක් බවය.
2. කර්ම විපාකයන්ගෙන් ගැලවීමට කිසිවකුට හැකියාවක් නැති බවය.
3. පුද්ගල ස්වාධීනත්වය හා ශක්තිය මගින් පෞරුෂය ගොඩනගා ගත හැකි බවය.
4. ආත්මාර්ථය පිණිස මෙන්ම පරාර්ථය පිණිසද එකසේ ක්‍රියා කළ යුතු බවය.
5. බියජනක සසර ජය ගැනීමට නිරන්තරයෙන් ක්‍රියාකළ යුතු බවය.

19. බුදු සමය සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය , පරිණාමය හා විකාශය හේතුප්‍රත්‍යාකාරව විග්‍රහ කොට ඇත. ඒ අනුව සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ පැහැදිලි වන සූත්‍ර දේශනාව වන්නේ,
1. අස්සලායන සූත්‍රය.
2. මධුර සූත්‍රය.
3. චක්ක වත්ති සීහනාද සූත්‍රය.
4. අග්ගඤ්ඤ සූත්‍රය.
5. කූටදන්ත සූත්‍රය.

20. රාජ්‍ය පාලකයන් විසින් නිර්ධනයන්ට මුදල් නොදීම නිසා දිළිඳු බව ඇතිවීම , එම නිසාම සොරකම අවි-ආයුධ , ප්‍රාණඝාතය , බොරුව , ඊර්ෂ්‍යාව , ක්‍රෝධය , මුසාවාදය , කාමයෙහි වරදවා හැසිරීම ආදියද ඇතිවිය. මෙම ළාමක ධර්මයන් ඇතිවන අයුරු පෙන්වා දෙන සූත්‍රය වන්නේ,
1. විමංසක සූත්‍රය යි.
2. අග්ගඤ්ඤ සූත්‍රය යි.
3. අධම්මික සූත්‍රය යි.
4. කූටදන්ත සූත්‍රය යි.
5. චක්ක වත්ති සිහනාද සූත්‍රය යි.

21. පාලකයා විසින් ''මහජනයා වෙනුවෙන් කාලය , ශ්‍රමය හා භෞතික සම්පත් කැප කළ යුතු බව'' දැක්වෙන බෞද්ධ දේශපාලන මුලධර්මයක් ලෙස දැක්වෙන්නේ,
1. පංචශිල ප්‍රතිපදාව වලය.
2. දස සක්විති වත් වලය.
3. දසරාජ ධර්ම වලය.
4. සප්ත අපරිහානිය ධර්ම වලය.
5. සතර සංග්‍රහ වස්තු වලය.

22. ''කම්මැලි වූ කායික , චෛතසික වීර්යය නැති කෙනෙකුගේ සියක් අවුරුදු ජීවිතයට වඩා දැඩි වීර්යයෙන් යුක්තයාගේ එක දවස ජීවත්වීම ඉතා උතුම්ය'' යන්න නිශ්චය කරන ධම්මපද ගාථා පාඨය වන්නේ,
1. ''සහස්සම්පි චේ වාචා....''
2. ''යෝචේ වස්ස සතං ජීවේ..''
3. ''කායෙන සංවරෝ සාදු..''
4. ''ජයං වේරං පසවති...''
5. ''අචරිත්වා බ්‍රහ්මචරියං...''

23. හොඳ නරක ක්‍රියා විනිශ්චය කිරිමේදි තමා තමාට හදුනාගත හැකි නිර්ණායක බුදු දහමේ පෙන්වා දී ඇත. ඒ අනුව කුසලා කුසල කර්ම විනිශ්චය කළ හැකි එක් නිවැරදි නිර්ණායකයක් වන්නේ,
1. අත්තා හිත බව හා පරහිත බව පරීක්ෂා කොට බැලීමයි.
2. ධර්මය උගත් පඩිවරයෙකුගෙන් විමසා දැන ගැනිමයි.
3. ගුරු උපදෙස් වලට අනුගත විමයි.
4. පරපුරෙහි පිලිගත් නිසා පිලිගැනිමයි.
5. ග්‍රන්ථ, පරිශීලනය කොට ඉන් ලබා ගන්නා දැනුම භාවිතයට ගැනිමයි.

24. සදාචාර සම්පන්න බෞද්ධ සමාජයක් නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික ගුණ ධර්ම රැසක් දැක්වේ. ඒ අතර ලද පමණින් සතුටු වීම , පහසුවෙන් පෝෂණය කළ හැකිවීම , කටයුතු බහුල නොවීම, සැහැල්ලු දිවි පෙවෙතක් ගත කිරීම , ඉන්ද්‍රිය සංවරය , සරල පැවැත්ම මගින් අර්ථවත් වන්නේ,
1. සුභරතාවයයි. 2. අල්පේච්ඡතාවයයි. 3. සනතුස්ථිතාවයයි.
4. ශ්‍රද්ධාවයි. 5. සතර සංග්‍රහ වස්තුවයි.

25. ආර්ථිකය සම්බන්ධ බෞද්ධ ආකල්පය මූලාශ්‍රයානුසාරයෙන් පැහැදිලි කෙරේ. ඒ අතර රාසිය ගාමිණි සූත්‍රයේ දී ධන පරිහරණය පිළිබඳ උපදේශයක් නොවන්නේ,
1. දැහැමිව ඉපයීම. 2. තමා සැපවත් වීම.
3. පරිත්‍යාග කිරීම. 4. අඹු දරුවන් පෝෂණය කිරීම.
5. ගිජු කමින් තොරවීම.

26. භෞතික සම්පත් කළමනාකරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් වඩාත් ප්‍රායෝගිකව උපදෙස් දී ඇති සූත්‍ර දෙකක් වන්නේ,
1. පත්තකම්ම සූත්‍රය හා චක්කවත්ති සීහනාද සූත්‍රයයි.
2. කූටදන්ත සූත්‍රය හා වෙළුද්වාර සූත්‍රයයි.
3. ඉණ සූත්‍රය හා පරාභව සූත්‍රය.
4. අනණ සූත්‍රය හා වසල සූත්‍රය.
5. සිඟාලෝවාද සූත්‍රය හා ව්‍යග්ගපජ්ජ සූත්‍රයයි.

27. සමාජයේ සුරක්ෂිතතාව පිණිස අනුගලමනය කළ යුතු මූලික බෞද්ධ ප්‍රතිපදාවක් ලෙස සැලකෙන්නේ,
1. පංච ශීලයයි. 2. දසරාජ ධර්මයයි. 3. සප්ත අපරිහානිය ධර්මයයි.
4. සතර සංග්‍රහ වස්තුවයි. 5. සතර අගතියෙන් තොර වීමයි.

28. සිගාලෝවාද සූත්‍රගත ඉගැන්වීම් අනුව ''සමජ්ජාභිචරණං'' හැඳින්වීමට වඩාත් සුදුසු ප්‍රකාශය වන්නේ,
1. මත්ද්‍රව්‍ය වලට ගිජු වීමයි.
2. සුදුවෙනි ගිජු වීමයි.
3. ස්ත්‍රීන්ට ගිජු වීමයි.
4. නුසුදුසු කාලවලදී සුදුසු ස්ථානවල ගැවසීමෙහි ගිජුවීමයි.
5. නෘත්‍ය සංදර්ශන බැලීමෙහි ගිජු වීමයි.

29. සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන සදිසා සංකල්පය තුළින් එක් එක් සමාජ කණ්ඩායම් ඉදිරිපත් කළයුතු යුතුකම් හා වගකීම් දැක්වේ. ඒ අනුව සේවකයාගෙන් ස්වාමියාට ඉටුවිය යුතු යුතුකමක් ලෙස දැක්වෙන්නේ,
1. සෞඛ්‍ය පහසුකම් සපයාදීමයි.
2. ඇඳුම් පැළඳුම් සපයාදීමයි.
3. වැඩ කටයුතු ඉතා හොඳින් කර දීමයි.
4. අවමන් නොකිරීමයි.
5. ගරු කිරීමයි.

30. ''තමාට හැකියාව තිබිය දී මහලුව ජරාවට ගිය මව හෝ පියා හෝ පෝෂණය නොකරයිද එය පිරිහිමට හේතුවේ'' යන අදහසට සුදුසු ගාථාව වන්නේ,
1. ''මාතාපිතු උපට්ඨානං..'' 2. ''යෝ මාතරංවා පිතරංවා...''
3. ''අසන්තස්ස පියා හොන්ති..'' 4. ''ගාරෝව නිවාතෝව...''
5. ''නිද්දාශීලි සභාසීලි..''

31. ''පවිටු නරක මිතුරන් ඇසුරු නොකළ යුතුය , අධම පහත් මිනිසුන් ඇසුරු නොකළ යුතුය , කළ්‍යාණ මිත්‍රයන් ඇසුරු කළ යුතුය , උතුම් මිනිසුන් ඇසුරු කළ යුතුය''. යන අර්ථයට සුදුසු ගාථා පාඨය වන්නේ,
1. ''න හපේ පාපකේ මිත්තේ.....''
2. ''නපරේසං විලෝමානි.....''
3. ''න අත්ත හේතු න පරස්ස හේතු.....''
4. ''අත්තනාව කතං පාපං.....''
5. ''අචරිත්වා බ්‍රහ්ම චරියං.....''

32. බුදුරාජාණන් වහන්සේගේ ධර්ම ප්‍රචාරක සේවාව නිසි ලෙස ඉටුකර ගැනීම සඳහා තම දායකත්වය මනා ලෙස ලබාදුන් භික්ෂු භික්ෂණී උපාසක උපාසිකා පිරිස් ඇසුරෙන් ඔබ සිත්ගත් භික්ෂුණී චරිත දෙක වන්නේ,
1. ඛේමා තෙරණිය,උප්පලවණ්ණා තෙරණිය.
2. පටාචාරා තොරණිය,ධම්මදින්නා තෙරණිය.
3. කිසාගෝතමී තෙරණිය,නන්දා තෙරණිය.
4. සේලා තෙරණිය,සෝමා තෙරණිය.
5. ශකුලා තෙරණිය,සුබා තෙරණිය.

33. සාම්ප්‍රදායික මුලාශ්‍ර වලට අනුව ථෙරවාදී ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා විවිධ හේතු බලපා ඇති බව සඳහන් වේ. ඒ අනුව තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට ප්‍රමුඛ හේතුවක් ලෙස සැලකෙන්නේ,
1. සුභද්‍ර භික්ෂුවගේ නොහික්මුණු ප්‍රකාශය.
2. බුද්ධ වචනය විවිධ අයුරින් නිර්වචනය කිරීම.
3. වජ්ජී පුත්තක භික්ෂුන් විසින් ඉදිරිපත් කළ දස වස්තුව.
4. විසිරි තිබූ ධර්ම විනය එක්රැස් කොට ආරක්ෂා කිරීම.
5. අන්‍යතිර්ථකයන් ලාභ අපේක්ෂාවෙන් සසුන්ගත වීම.

34. පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස විනය මෙන්ම ධර්මය ද පිරිසිදුව මුඛ පරපුරෙන් පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ ධර්මධර හා විනයධර මහා තෙරුන්ට පැවරුණි. ඒ අතරින් දිඝ නිකාය පවත්වාගෙන යාමේ වගකීම පැවරුණේ,
1. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පුම්බ ශිෂ්‍ය පරපුරටය.
2. සැරියුත් මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍ය පරපුරටය.
3. ආනන්ද මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍ය පරපුරටය.
4. අනුරුද්ධ මහා රහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍ය පරපුරටය.
5. සියලුම භික්ෂුන් වහන්සේලාටය.

35. අශෝක අධිරාජයා බෞද්ධයෙකු වුවද සෑම ආගමකටම ගරු කළේය. ඒ අනුව සෑම ආගමිකයෙකු කෙරෙහිම සමානාත්මතාවයකින් කටයුතු කළයුතු බවට දැක්වෙන්නේ,
1. 13 වන ගිරි ලිපියේය.
2. 3 වන ගිරිනාර් ගිරි ලිපියේය.
3. කාල්සි ගිරි ලිපියේය.
4. 7 වන ගිරිනාර් ගිරි ලිපියේය .
5. ටැම් ලිපියේය.

36. ''ද්විතිය ධර්මාශෝක'' යන නමින් ප්‍රකට වුයේ,
1. කනිෂ්ක රජතුමාය.
2. බිංදුසාර රජතුමාය.
3. අශෝක රජතුමාය.
4. දේවානම්පියතිස්ස රජතුමාය.
5. දුටුගැමුණු රජතුමාය.

37. භාරතීය විශ්වවිද්‍යාල අතර හීනයානික බුදු දහමේ ඉගැන්වීම් වලට කේන්ද්‍රස්ථානය වුයේ,
1. නාලන්දා විශ්වවිද්‍යාලයයි. 2. වලභි විශ්වවිද්‍යාලයයි. 3. ජගද්දලා විශ්වවිද්‍යාලයයි.
4. සෝමපුර විශ්වවිද්‍යාලයයි. 5. වික්‍රමශිලා විශ්වවිද්‍යාලයයි.

38. පුරාණ භාරතීය විශ්වවිද්‍යාල අතර ප්‍රකට විශ්ව විද්‍යාලයක් වන වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු සඳහා මණ්ඩල ගණනාවකට බෙදා ඇත. ඒ සඳහා නුසුදුසු මණ්ඩලය වුයේ,
1. ආචාර්ය මණ්ඩලය. 2. අධ්‍යාපන මණ්ඩලය. 3. ප්‍රවේශ මණ්ඩලය.
4. පරිපාලන මණ්ඩලය. 5. සාකච්ඡා මණ්ඩලය.

39. ප්‍රාග් මහින්ද ලංකාවේ විවිධ ඇදහිලි හා විශ්වාස පැවති බවට ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක මගින් සනාථ වී ඇත. ඒ අතර ජනාදරයට පාත්‍ර වුයේ යැයි සනාථ නොවූ ඇදහිල්ල වන්නේ,
1. රුක්ෂ වන්දනාවයි.
2. යාගය හා ශිව ලිංග වන්දනාවයි.
3. මළවුන් හා ප්‍රේත වන්දනාවයි.
4. ධාතු හා බෝධි වන්දනාවයි.
5. යක්ෂ යක්ෂනියන් වන්දනාවයි.

PAST PAPERS WIKI

40. ප්‍රාග් බෞද්ධ ලංකාවේ මළවුන් ඇදහීම ජනප්‍රිය ඇදහිල්ලක් බවට පත්ව ඇත. එය තේමා කරගත් මිහිඳු මහ රහතන් වහන්සේ දෙසු දහම වන්නේ,
1. චුල්ලහත්ථීපදෝපම සූත්‍රය හා පේත වත්ථුවයි.
2. විමානවත්ථු හා පේත වත්ථුවයි.
3. අරියපරියේසන සූත්‍රය හා විමාන වත්ථුවයි.
4. චුල්ලහත්ථීපදෝපම සූත්‍රය හා ධම්මචක්කපවත්වන සූත්‍රයයි.
5. චුල්ල කම්ම විභංග සූත්‍රය හා පේත වත්ථුවයි.

41. ලාංකීය රාජ්‍ය පාලන කටයුතුවලදි රජුට උපදෙස් දීම බෞද්ධ භික්ෂුවගෙන් සිදු වූ ප්‍රබල මෙහෙවරකි. ඒ අනුව නිවැරදි වන්නේ,
1. දෙවන පෑතිස් රජුට මිහිඳු හිමියන්ද.
2. වලගම්බා රජුට කුපික්කල මහා තිස්ස හිමියන්ද.
3. සද්ධාතිස්ස රජුට කාල බුද්ධ රක්ඛිත හිමියන්ද.
4. දුටුගැමුණු රජුට ගෝධගතතිස්ස හිමියන්ද.
5. ඉහත සඳහන් සියල්ලම නිවැරදිය.

42. ''ආහාර ගැනීමට පෙර භික්ෂූන් වහන්සේලාට දන් දීම සිරිතක් වශයෙන් පවත්වාගෙන යාමේ'' පිළිවෙත සිදු කරන ලද්දේ,
1. අශෝක රජතුමා විසිනි.
2. මහසෙන් රජතුමා විසිනි.
3. දුටුගැමුණු රජතුමා විසිනි.
4. වළගම්බා රජතුමා විසිනි.
5. දේවානම්පියතිස්ස රජතුමා විසිනි.

43. අනුරාධපුර මහා විහාරය ඉතිහාසය තුළ ආගමික හා ජාතික වශයෙන් අති විශිෂ්ට සේවාවක් ඉටු කරනු ලැබුවකි. එම සේවාවන් අතරට නොගැළපෙන්නේ,
1. ථෙරවාදි බුදුදහමේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීම.
2. ථෙරවාදි ආරක්ෂකයා හා ප්‍රචාරකයා ලෙස කටයුතු කිරීම.
3. මහායානික දර්ශනය ස්ථාවර වීමට සහයෝගය දැක්වීම.
4. දේශීය හා විදේශීය වශයෙන් ධර්ම ප්‍රචාරණ කටයුතු සිදුවීම.
5. දේශීය සංස්කෘතියේ අනන්‍යතාව තහවුරු කිරීම.

44. ලාංකීය ඉතිහාසයේ සංස්කෘතිය පෝෂණය කිරීමට අභයගිරි විහාරය විශිෂ්ට කාර්යභාර්යක් ඉටු කළහ. ඒ අතර ලාංකීය සාහිත්‍යයේ ''ජාතකට්ඨ කතාව'' නිර්මාණය කිරීමේ ගෞරවය හිමි වන්නේ,
1. මහා විහාරයටය. 2. ජේතවනාරාමයටය. 3. අභයගිරියටය.
4. පූර්වාරාමයටය. 5. ලංකාරාමයටය.

45. ජපානයට බුදු දහම ලැබීමත් සමග එරටෙහි සංස්කෘතියෙහි සුවිශේෂී වෙනස්කම් සිදු වූ අතර කළගුණ සැලකීමේ පුරුද්ද කලාත්මකව යොදාගත් අවස්ථා ද දක්නට ලැබේ. ඒ අතර බුද්ධ පරිනිර්වාණය සිහි ගන්වන උත්සවය වන්නේ,
1. ජෝදෝ උත්සවය. 2. නෙහන් උත්සවය. 3. බොන් උත්සවය.
4. හනමන්සුරි උත්සවය. 5. කබුකි උත්සවය.

46. චීනයට බුදුදහම හඳුන්වා දීම සම්බන්ධව විවිධ අදහස් පවති. ඒ අතර කාශ්‍යප මාතංග හා ධර්මරක්ෂ යන හිමිවරු බුදු දහම හඳුන්වා දෙනු ලැබූ යුගය ලෙස සැලකෙන්නේ,
1. ෂෝතෝකුතෙෂි අධිරාජ්‍ය යුගයේය.
2. හැන්මින්දි අධිරාජ්‍ය යුගයේය.
3. කිම්මෙයි අධිරාජ්‍ය යුගයේය.
4. සුයිකේන් අධිරාජ්‍ය යුගයේය.
5. ගෙම්මන් අධිරාජ්‍ය යුගයේය.

47. ගන්ධාර සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමාවල විශේෂ ලක්ෂණයක් නොවන්නේ,
1. මහා කාරුණික ලීලාව දැක්වීමයි.
2. අත් සංවරව සිරුරට ලංව තිබීමයි.
3. පද්මාසනය නෙළුම් මල මත පහසුවෙන් වැඩ සිටින විලාසයයි.
4. හිසකේ ස්වාභාවිකව දැක්වීමයි.
5. නෙත් අඩවන්ය , තොල් සිහින්ය , පරිමාණුකූල කම්මුල් වලින් යුක්ත වීමයි.

48. පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුව ලංකාවේ ඉපැරණිම ස්තූපය ලෙස හඳුන්වා ඇත්තේ,
1. ථූපාරාමයයි. 2. මයියංගණයි. 3. රුවන්වැලි මහා සෑයයි.
4. ජේතවනාරාමයයි. 5. අභයගිරියයි.

49. ශ්‍රී ලාංකීක කලාකරුවන්ගේ කලා කෞෂල්‍ය ප්‍රකට කෙරෙන සදකඩපහණේ අන්තර්ගත සංකේත වලින් විවිධ අරුත් නිරූපණය වන බව වියතුන් විසින් පෙන්වා දී ඇත. ඒ අතරින් මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරින්ගේ අර්ථ නිරූපණය වන්නේ සදකඩපහණින්,
1. සෞභාග්‍ය සංකේතවත් වන බවය.
2. සංසාර චක්‍රය නිරූපණය වන බවය.
3. පාරිශුද්ධත්වය නිරූපණය කරන බවය.
4. දිව්‍ය ලෝකය නිරූපණය කරන බවය.
5. නිර්වාණය සංකේතවත් කරන බවය.

50. මහනුවර යුගය හා නූතන යුගයන්ට අයත් සිතුවම් කළ ස්ථාන කිහිපයක් පහත දැක්වේ.
A - රිදී විහාරය B - මැද්දේපොළ විහාරය C - දෙගල්දොරුව විහාරය
D - කැලණියේ අලුත් විහාරය E - දඹුල්ල විහාරය F - බොරැල්ලේ ගෝතමී විහාරය
මේ අතරින් නූතන යුගයට අයත් සිතුවම් දැක්වෙනුයේ,
1. A.B.C වලය. 2. C.D.E වලය. 3. E.B.D වලය.
4. B.D.F වලය. 5. D.E.F වලය.

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -පෙරහුරු පරීක්ෂණය **2026**
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය	45	S	I I	බෞද්ධ ශිෂ්ටාචාරය II **Buddhist Civilization II**	කාලය : පැය තුනයි **Time : Three hours**

අමතර කියවීම් කාලය මිනිත්තු 10යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න .

උපදෙස්:

- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමි වේ.

---

1 කොටස

(1) (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් ස්වධර්ම හතරක් නම් කරන්න (ලකුණු 02යි)

(ii) සන්‍යාසි ආශ්‍රමයට අයත් කාර්යයන් තුනක් ගෙනහැර දක්වන්න (ලකුණු 03යි)

(iii) බුද්ධකාලීන පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර පැවැති සබඳතා උදාහරණ පහක් ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 04යි)

(iv) බුද්ධකාලීන භාරතයේ පැවැති රාජාණ්ඩු පාලන ක්‍රමය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 05යි)

(v) මක්ඛලිගෝසාලගේ ආගමික ඉගැන්වීම් බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විචාරයට ලක් කරන්න (ලකුණු 06යි)

(02) (i) බුදුරජාණන් වහන්සේ අනුත්තර පුරුසදම්ම සාරථී නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක දෙකක් නම් කරන්න (ලකුණු 02යි)

(ii) බුද්ධකාලීන භාරතීය සමාජයේ කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයක් පැවැති බවට සාධක හතරක් දක්වන්න (ලකුණු 03 යි)

(iii) ප්‍රශ්න විසඳීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් භාවිත චතුර්විධ ක්‍රමවේදය කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 04 යි)

(iv) බුදුරජාණන් වහන්සේ ආගමික සහනශීලීතාව ප්‍රකට කළ අවස්ථා දෙකක් විස්තර කරන්න (ලකුණු 05 යි)

(v) අනාථපිණ්ඩික උපාසකතුමා සතුව පැවැති ගුණාංග හතරක් ගෙනහැර දක්වන්න (ලකුණු 06 යි)

Past Papers Wiki

(03) (i) "සහස්සමපි චේ වාචා" යන ධම්මපද පද ගාථාව සම්පූර්ණ කරන්න (ලකුණු 02 යි)

(ii) ඉහත 3 (i)හි ගාථාවේ අර්ථය නිවැරැදිව ලියා දක්වන්න (ලකුණු 03 යි)

(iii) ගුරු - ශිෂ්‍ය යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න (ලකුණු 04 යි)

(iv) ගිහි ජීවිතයක පරිහානියට බලපාන හේතු වළක්වා ගැනීමෙන් දියුණුව උදාකර ගත හැකි බව පරාභව සූත්‍රාගත සාධක පහක් ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 05 යි)

(v) පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන මංගල සූත්‍රාගත කරුණු හයක් පිළිබඳ කෙටි විවරණයක් කරන්න (ලකුණු 06 යි)

II කොටස

(04) (i) පුද්ගල ස්වාමිත්වය පිළිබඳ බුදුසමයේ ආකල්පය වෙනත් සමකාලීන ආගමික ඉගැන්වීම්වලින් වෙනස් වන අයුරු පැහැදිලි කරන්න (ලකුණු 10 යි)

(ii) සමාජ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහය අග්ගඤ්ඤ සූත්‍රානුසාරයෙන් ගෙනහැර දක්වන්න (ලකුණු 10 යි)

(05) (i) ගෘහස්ථ ජීවිතයේ සාර්ථකත්වය සඳහා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ මූලධර්ම අදාළ කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න (ලකුණු 10 යි)

(ii) සෞන්දර්ය රසාස්වාදය පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ඉවහල් කරගත හැකි ආකාරය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විවරණය කරන්න (ලකුණු 10 යි)

(06) (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා බලපෑ හේතු සාධක පැහැදිලි කර, එහි ප්‍රතිඵල සමාලෝචනය කරන්න (ලකුණු 10 යි)

(ii) චීනයට බුදු දහම ලැබුණු ආකාරය ගෙනහැර දක්වා, චීන භික්ෂූන් වහන්සේලාගෙන් සිදුවූ සේවාව ඇගැයීමට ලක්කරන්න (ලකුණු 10 යි)

(07) (i) තායිලන්තයේ සංස්කෘතියේ පෝෂණයට බුදු සමයෙන් ලැබුණු ආලෝකය නිදසුන් මගින් ප්‍රකට කරන්න (ලකුණු 10 යි)

(ii) ධර්මාශෝක රජතුමාගෙන් සිදු වූ ශාසනික මෙහෙය ප්‍රමාණවත් සාධක මගින් ඇගයීමට ලක් කරන්න (ලකුණු 10 යි)

(08) (i) ප්‍රාග් බෞද්ධ යුගයේ ශ්‍රී ලාංකේය ජනතාව අතර ප්‍රචලිතව පැවැති ඇදහිලි හා විශ්වාස නිදසුන් මගින් ප්‍රකට කරන්න (ලකුණු 10 යි)

(ii) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න

(i) චතුර්විධ සුබය
(ii) නාට්‍ය කලාව කෙරෙහි බෞද්ධ ආභාසය
(iii) වාහල්කඩ
(iv) වලහි විශ්ව විද්‍යාලය

(ලකුණු 5*2=10යි)

බෞද්ධ ශිෂ්ටාචාරය 2026

1 වන පත්‍රය - පිළිතුරු

1) 2	2) 1	3) 5	4) 5	5) 5	6) 1	7) 3	8) 3	9) 5	10) 2
11) 3	12) 5	13) 2	14) 4	15) 3	16) 4	17) 4	18) 3	19) 4	20) 5
21) 3	22) 2	23) 1	24) 2	25) 4	26) 5	27) 1	28) 5	29) 3	30) 2
31) 1	32) 4	33) 5	34) 3	35) 4	36) 1	37) 2	38) 5	39) 4	40) 2
41) 5	42) 2	43) 3	44) 3	45) 2	46) 2	47) 3	48) 1	49) 2	50) 4

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank